හිතවත් බැංකු ගනුදෙනුකරුවනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන (Key Fact Documents) මාලාවක් සකස් කර ඇති අතර, ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන පරිදි අපගේ බැංකුව විසින් සපයන බැංකු ගිණුම් පහසුකම්/සේවාවන් තෝරාගැනීම පිණිස ඔබට සහාය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

පෞද්ගලික බැංකු කටයුතු සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් හි තිබෙන ගිණුම් ආශ්‍රිත සුවිශේෂ පැකේජ සහිත විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පිළිබඳව සහ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව පුළුල් සංක්ෂිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයෙන් ඔබ වෙත සපයනු ලැබේ.

කෙසේ වුව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයේ සඳහන් මතු සඳහන් කාරණාවන් නෛතික සහ නියාමන වෙනස්කම්වලට අනුව සහ අපගේ බැංකුවේ ප්‍රතිපත්තිවල සහ කාර්ය පටිපාටිවල සිදුවන වෙනස්ම්වලට අනුකූලව ප්‍රතිශෝධනය වීමක් අවශ්‍ය වන බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු ලබාගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර www.nationstrust.com වෙබ් අඩවියට පිවිස හෝ 0114 711 411 දරන දුරකථන අංකයෙන් හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඔස්සේ අප බැංකුව ඇමතීමට කාරුණික වන්න.

පහත සඳහන් ඔබගේ යම් කවරම වූ ගිණුමක් සම්බන්ධයෙන් යම් කවරම වූ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට ඇත්නම්, එම පැමිණිල්ල පිළිබඳ දැන්වීම අඩංගු ලුහුඩු ලිඛිත ප්‍රකාශයක් අප බැංකුවේ ;

**පැමිණිලි විසඳීමේ නිලධාරී, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනයට භාරදීමෙන් හෝ දුරකථන අංක **[+94(0)11 4711411]** ඔස්සේ අප ඇමතීමෙන් හෝ customersesrvice@nationstrust.com යන විද්‍යුත් තැපෑලට යොමු කිරීමෙන් දැනුම් දිය හැකි අතර, ඒ පිළිබඳව අප බැංකුව විසින් ඔබ වෙත ක්ෂණිකව ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබඳ විස්තරය | බැංකු ගණුදෙනුකරුවන්ට අත්වන වාසි | ගාස්තු වර්ග සහ බැංකුව විසින් පනවන වෙනත් අයකිරීම් | ගිණුම විවෘත කිරීම පිණිස අනුගමනය කළයුතු කාර්ය පටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **ඇ) ළමා ගිණුම්** | | | | |
| **නේෂන්ස් කිඩ්ස් ඉතිරි කිරීමේ ගිණුම (Nations Kidz Savings Account)**<br>මෙම ගිණුම වයස අවුරුදු 18ට අඩු ළමයෙකු වෙනුවෙන් මාපියෙකු හෝ නිතිමය භාරකරවෙකු විසින් විවෘත කළ හැකිය. | • වරණීය පොලී අනුපාතය.<br><br>• ශේෂය මත තිලිණ පිරිනැමීම | • ගිණුම වසා දැමීමේ ගාස්තු | කිඩ්ස් ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කිරීම සඳහා වන බැංකුවේ සම්මත ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට පහත සඳහන් ලියකියවිලි ද සමග බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය යුතුය.<br><br>• ළමයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත<br><br>• මාපියාගේ / භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ / වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්.<br><br>• පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයෙන් වෙනස් වන විටක දී, ලිපිනය තහවුරු කරගැනීම පිණිස ලේඛනමය සාක්ෂි අවශ්‍ය වනු ලැබේ. | • වයස අවුරුදු 18 ට අඩු ශ්‍රී ලාංකික ජාතිකයෙකු වන ළමයකුගේ මාපියන් (භාරකරුවන්) විසින් ළමයා වෙනුවෙන් ගිණුම විවෘත කිරීම සිදු කළ හැකිය.<br><br>• අධ්‍යාපනය සහ වෛද්‍ය ගාස්තු වැනි ළමයාගේ තීරණාත්මක අවශ්‍යතාවයන් මත පමණක් වලංගු ලියවිලි පදනම් කරගෙන සහ බැංකුවේ තනි අභිමතය පරිදි ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට ඉඩදෙනු ලැබේ.<br><br>• ළමයා වයස අවුරුදු 18 සම්පූර්ණ කිරීමෙන් පසුව ගිණුමෙන් මුදල් ලබා ගැනීමට හෝ ගිණුම සුදුසු පරිදි යම් වෙනත් වැඩිහිටි ගිණුමකට පරිවර්ථනය කිරීමට ළමයාට හිමිකම තිබේ. |